"එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට්" ජයග්‍රාහකයින් ජාතික තලයට

2019 ඔක්තෝබර් 16 : "එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට්" තරඟයේ කාන්තා විවෘත අංශයේ ශූරතාව දිනූ ශයනි සේනාරත්න ක්‍රීඩිකාව කාන්තා නැගී එන කණ්ඩායමේ සාමාජිකයන් 15 දෙනාගේ සංචිතයට ඇතුළත් කිරීමෙන් පසු 2019 ACC කාන්තා නැගී එන කණ්ඩායම් ආසියා කුසලාන තරගාවලියේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා තෝරාගෙන තිබේ. එසේම කාන්තා විවෘත කාණ්ඩය නියෝජනය කරමින් අනුශූරතාවය දිනාගත් මල්ෂා මධූෂානි ද මෙම දකුණු ආසියානු තරගාවලිය සඳහා තේරී පත්වී ඇත.මෙම තරගය තුළින් ඔවුන් ක්‍රිකට් ලෝකයට නිරාවරණය වූ අතර "එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට්" සුපිරි 14 දෙනාගෙන් 8 දෙනකුම මේ වන විට ශ්‍රී ලංකා ක්‍රිකට් හි ජාතික තලයට තේරී පත්වී තිබේ.

"ස්ලිංග මාලිංග" ලෙස කාගේත් ආදරය දිනූ ශයනි සේනාරත්න නුවර ප්‍රදේශය නියෝජනය කරමින් එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් තරඟයට සහභාගී වූ අතර මේ වන විට ඇයගේ පන්දු යැවීමේ වේගය පැයට කි.මී 104 කි. කෙසේවුවත් ලංකාවේ වේගපන්දු යවන්නන් සොයා යාමේ මෙහෙයුම වන එයාර්ටෙල් ෆාස්ටස්ට් තරගය ආරම්භ වූ මුල් අවධියේදී ඇය විසින් වාර්තා කරන ලද්දේ පැයට කි.මී,88 ක වේගයක් පමණක් වූ අතර ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ හිටපු වේගපන්දු පුහුණුකරු වන අනුෂ සමරනායක මහතාගේ මගපෙන්වීම යටතේ තුන්වන වටය වන විට ඇයගේ වේගය පැයට කි.මී.98 වේගයක් දක්වා වර්ධනය කරගනිමින් අවසන් 14 දෙන අතරට තේරී පත්වීමට හැකියාව ලැබිණි.

එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් සමස්ත තරඟයේ ජයග්‍රාහකයා වූ එෂාන් මාලිංග හෙවත් පොඩි මාලිංග අවසන් තරඟයේදී පැයට කි.මී. 141 ක වේගයක් වාර්තා කල අතර ඔහු මේ වනවිට CCC (Colombo Cricket Club) ක්‍රීඩා සමාජය නියෝජනය කිරීමේ වරම් හිමි කරගෙන තිබේ. ඔහු තරගාවලිය සඳහා සහභාගී වූ මුල් අවධියේදී වාර්තා කරන ලද්දේ පැයට කි.මී.131 ක වේගයක් පමණි.එසේම 19 න් ඉහළ කාණ්ඩය නියෝජනය කළ මලිඳු ෂෙහාන් මේ වන විට පැයට කි.මී. 140 ක වේගයක් වාර්තා කරන අතර ඔහු විසින් මුලදී වාර්තා කරනු ලැබුයේ පැයට කි.මී.123 ක වේගයකි. ඔහුට ද මේ වන විට BRC (Burgher Recreational Club) ක්‍රීඩා සමාජය නියෝජනය කිරීමේ අවස්ථාව උදා වී ඇත.

මීට අතිරේකව අවසන් 14 දෙනාට තේරී පත් වූ 19 න් ඉහළ කාණ්ඩය නියෝජනය කළ මොහමඩ් ෆාහිම් පොලිස් ක්‍රීඩා සමාජයත්, රසාංජන අරවින්ද, ටැමිල් යුනියන් ක්‍රීඩා සමාජයත් අරුන් ප්‍රකාශ් මුවර්ස් ක්‍රීඩා සමාජයත් නියෝජනය කරනු ලබන අතර රසාංජන අරවින්ද සම්පත් බැංකු කණ්ඩායම ද නියෝජනය කරනු ලබයි.එසේම 19 න් පහළ කාණ්ඩය නියෝජනය කළ චිරාන් තීක්ෂණ සහ මලීෂ දුරන් මේ වන විට BRC Burgher Recreation Club ක්‍රීඩා සමාජය නියෝජනය කිරීම සඳහා තෝරාගෙන ඇති අතර ජනිත් මධූෂාන් රාගම ක්‍රිකට් කණ්ඩායමට් තේරී පත්වී තිබේ.

ශ්‍රී ලංකාවේ වේගවත්ම පන්දු යවන්නා සොයා යාමේ මෙහයුමේ පළමු අදියර සනිටුහන් කරමින් "එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට්" තරඟාවලිය 2019 පෙබරවාරි මස ඇරඹුන අතර දිස්ත්‍රික්ක 11 ක් ආවරණය කරමින් මේ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 10000 කට අධික ප්‍රමාණයක් සහභාගී විය. එහිදී අවසන් වට සඳහා තරඟ වැදීමට ක්‍රීඩක ක්‍රීඩිකාවන් 145 දෙනකු තෝරාගත් අතර ඔවුන්ට තමන්ගේ දක්ෂතා පූර්ණ ලෙස වර්ධනය කරගැනීමේ හැකියාව මෙහිදී උදාවිය. ඔවුන්ගේ පළමු කායික සුවතා පරීක්ෂාවේ සිට අවසන් පුහුණු සැසි දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් වීරයින් වන අනුෂ සමරනායක, වත්මන් T20 නායක සහ ලෝකයේ අද්විතීය යෝකර් පන්දු යවන්නා ලෙස විරුදාවලිය ලත් ලසිත් මාලිංග ඇතුළුව චමින්ද වාස්, හෂාන් තිලකරත්න, සහ උපුල් චන්දන යන ශ්‍රී ලංකාවේ හිටපු ක්‍රිකට් තරු වල මගපෙන්වීම, සහ අධීක්ෂණය යටතේ ඔවුන් මනා පුහුණුවක් ලබා අද වනවිට ජාතික තලය නියෝජනය කරමින් සිටින අතර අනාගතයේදී ජාත්‍යන්තර තලය දක්වා ගමන් කරනු ඇති බව එයාර්ටෙල් ආයතනය විශ්වාස කරයි.

අවසානයි.

ඡායාරූප 01- එයාර්ටෙල් ෆාස්ටස්ට් කාන්තා විවෘත කාණ්ඩයේ ශූරාතාව දිනූ ශයනි සේනාරත්න,ඇය වර්තමානයේ කාන්තා නැගී එන ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකාවක් වන අතර 2019 ආසියානු නැගී එන කාන්තා ක්‍රිකට් කුසලාන තරඟාවලිය ද නියෝජනය කරයි

ඡායාරූප 02-එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් ශූරතාව දිනූ එෂාන් මාලිංග වර්තමානයේ CCC ක්‍රීඩා සමාජය නියෝජනය කරයි

ඡායාරූප 03-එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට් 19 න් ඉහළ ශූරතාව දිනූ මලිඳු ෂෙහාන් වර්තමානයේ BRC ක්‍රීඩා සමාජය නියෝජනය කරයි

භාරති එයාර්ටෙල් ලංකා පිලිබඳව

වර්ෂ 2009 ජනවාරි 12 වන දින ශ්‍රී ලංකාවේ මෙහයුම් ඇරඹූ භාරති එයාර්ටෙල් (එයාර්ටෙල් ලංකා ) පාරිභෝගිකයන් මිලියනයක් කරා ලඟා වී සිටින ශ්‍රී ලංකාවේ වේගවත්ම සන්නිවේදන ජාලය වේ. තම වාණිජ මෙහයුම් ඇරඹූ 2009 වර්ෂයේ සිට වසර 03 ක් වැනි කෙටි කාලයක් තුළ එයාර්ටෙල් ලංකාවේ සෑම ප්‍රදේශයක් කරාම ව්‍යාපත් වූ අතර අද වන විට මුළු දිවයිනම ආවරණය කරනු ලබයි.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති එයාර්ටෙල් ලංකා දුරකථන අන්තර්ජාල සේවාවන් සහ ආයතනික විසඳුම් ඇතුළු ඩිජිටල් ජංගම දුරකථන සේවාවන් රාශියක් පිරිනමයි.වැඩි විස්තර සඳහා " www.airtel.lk” වෙත පිවිසෙන්න.